# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1642/9 – 2010 පෙබරවාරි 23 වැනි අඟහරුවාදා – 2010.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: 3/6/7 / එල්ඩී/05/2007/ඊ/195

නික/සිරිසුමන සිරි මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 1307 අමුණුකොලේ ග්‍රාම නිලධාරි වසමේ සියඹලාගස්වැටිය ගම.

පිඹුරු අංක: අ.ග.පි. 1624 අතිරේක අංක 04; කැබලි අංක: 168; ඉඩමේ නම: මැද මූකළාන: මුළු ඉඩම් ප්‍රමාණය හෙක්. 18.4542; අත්කර ගැනීමට යෝජනා කරන ඉඩම් ප්‍රමාණය හෙක්. 0.6474; ඉඩමේ විස්තරය: සිරිසුමන සිරි මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සඳහා භාවිතා කරන ඉඩම; හිමිකම් කියන අය: ඩී. එම්. චන්ද්‍රාවතී.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 මැයි මස 05 දින පෙ.ව. 10.00 ට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2010 මැයි මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආර්. එම්. ඩබ්. එස්. සමරදිවාකර,
ප්‍රාදේශීය ලේකම්,
කොබෙයිගනේ.

2010 පෙබරවාරි මස 15 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 – 356

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 4/9/1/89.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2003/ඊ/527.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත සඳහන් ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයිම් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විලේගොඩ නැමති ගමේ අංක 84, විලේගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු. පි. ගා. 3708 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 පෙන්වා ඇති හෙක්. 0.0569 විශාල ජම්බුගහවත්ත නමැති ඉඩම (වරි. අංක 11, දේගොඩ පාර).

උතුරට: මු.පි.ගා. 2793 හි කැබලි අංක 05 මාර්ගය (නගර සභා); නැගෙනහිරට: මු.පි.ගා. 2793 හි කැබලි අංක 05 මාර්ගය (නගර සභා) සහ හරින්ද්‍ර කුලරත්න හිමිකම් කියන ජම්බුගහවත්ත, වරි. අංක 11, දේගොඩ පාර; දකුණට: මු.පි.ගා. 300 හි කැබලි අංක 09 සහ දේගොඩ පාර; බටහිරට: මු.පි.ගා. 300 හි කැබලි අංක 09 සහ දේගොඩ පාර සහ මු.පි.ගා. 2793 හි කැබලි අංක 05 සහ මාර්ග (නගර සභා).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 අප්‍රේල් මස 07 දින පෙ.ව. 10.00 ට අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2010 අප්‍රේල් මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජී. එල්. වර්ණන් පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්ගොඩ.

2009 දෙසැම්බර් මස 16 වැනි දින,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 – 357

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.